# ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ සුභ පැතුම් පණිවිඩය



සමෘද්ධිමත් කෘෂි ආර්ථිකයක් බිහිකරලීමේ නිරන්තර උත්සාහයක නිරත වන කෘෂිකර්ම අමාත්‍යාංශය ඒ සඳහා ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ආරම්භ කළේය. එහිදී තුන් අවුරුදු ආහාර නිෂ්පාදන සැලසුම් අනුව රටේ ආහාර නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවධානය යොමුව ඇත. දිවයිනේ සෑම ප්‍රදේශයක්ම, දිස්ත්‍රික්කයක්ම සහ පළාතක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන වෙනුවෙන් ප්‍රමුඛ දායකත්වය ලබාදීමට හැකිවීම වත්මන් කෘෂිකර්ම අමාත්‍යවරයා ලෙස මා ලද අනගි අවස්ථාවකි. මෙම ක්‍රියාවලිය අඛණ්ඩව සහ සාර්ථකව ක්‍රියාත්මක වෙතැයි මා තුළ දැඩි විශ්වාසයක් පවතින අතර ඒ සඳහා හදවතින්ම සුබ පැතුම් එක්කරමි.

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යනු එක් පාර්ශවයකට පමණක් සිදු කළ හැකි දෙයක් නොවේ. සියලුම පළාත් මෙම වැඩසටහන සඳහා උපරිම දායකත්වය සැපයිය යුතුය. සෑම පාර්ශවයක් විසින්ම කළ යුතු කාර්යයන් නිසියාකාරව ඉටු කිරීම තුළ පමණක් මෙහි සාර්ථකත්වය රැඳී පවතියි.

මෙම තුන් අවුරුදු සැලැස්ම අනුව වඩාත් ක්‍රමානුකූලව වගා කටයුතු සිදු කළ යුතුය. ඒ ඒ පළාත්වල පවතින පාරිසරික සාධක මත පිහිටා පසට ගැලපෙන බෝගය හඳුනාගෙන වගා සැලැස්ම ක්‍රියාත්මක කිරීම වැදගත්ය. මෙම සාමුහික ක්‍රියාවලියේ දී ජාතික ඉලක්ක ජය ගැනීමට නම් පළාත් අතර නිවැරදි සන්නිවේදනයක් තුළින් අන්‍යයෝන්‍ය අවබෝධය වර්ධනය කර ගත යුතුය.

රටේ ජනතාවගේ පරිභෝජනය සඳහා අවශ්‍ය ආහාර රට තුළම නිෂ්පාදනය කරමින්, කෘෂි ආර්ථිකය සවිබල ගන්වන ගොවි ප්‍රජාවගේ අතමිට සරු කරමින් කෘෂිකර්ම අංශය දියුණු කිරීමට ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ඉවහල් වනු ඇත. ඒ  සඳහා දිවයිනේ සෑම පළාතක්ම ස්වකීය වගකීම නොපිරිහෙලා ඉටු කරනු ඇතැයි මම අපේක්ෂා කරමි. සීමා මායිම් පසෙකලා එකම අරමුණක් වෙනුවෙන් අප සැම එක්වන්නේ නම්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ අපේක්ෂාව සඵල වනු නිසැකය.

දුමින්ද දිසානායක (පා.ම)
කෘෂිකර්ම අමාත්‍ය

# කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



දූපත් රාජ්‍යයක් වන අප විශිෂ්ඨ ගණයේලා සම්පත්වලට හිමිකම් කියන අතර ඉන් එක් සම්පතක් ලෙස කෘෂිකර්මාන්තය හැඳින්විය හැක. ග්‍රාමීය ජනතාවගෙන් 65% ක් පමණ කෘෂි ආර්ථිකයකට අයිතිවාසිකම් කියන අතර ඔවුන්ගේ දිවි පැවැත්ම කෘෂිකර්මාන්තය සමඟ බැඳී පවතී. තවද කාර්මික විප්ලවයත් සමඟ ලෝකයේ බොහෝ රටවල් නොයෙකුත් යාන්ත්‍රික කර්මාන්තවලට යොමු වීමත් සමඟ කෘෂිකර්මාන්තයට වූ අවධානය අඩු විණි. එහි ප්‍රතිඵලයක් ලෙස ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් විවිධ කතිකා ගෝලීය වශයෙන් ඇති කිරීමටත් විවිධ සම්මුතීන් ගෝලීය වශයෙන් ගෙන ඒමටත් සිදු විණි. අප ඉදිරියේ එලෙස පවතින ආහාර සුරක්ෂිතතාව පිළිබඳ අවධානම අවම මට්ටමක පවත්වා ගෙන යාම සඳහා ගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව ගරු අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස් පරිදි ගරු කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක ඇමතිතුමාගේත්, ජනාධිපති කාර්යාලය සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ මැදිහත් වීම මත ජාතික ආහාර නිෂ්පාදන තුන් අවුරුදු සැලැස්ම එළි දක්වන ලදී. මෙහි මුඛ්‍ය පරමාර්ථය වූයේ අප මිහිතලය තුල ස්වයංපෝෂිත ලෙස නිෂ්පාදනය කළ හැකි ආහාර බෝග වගා කිරීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක දැනුම, යටිතල පහසුකම්, බීජ, පොහොර වැනි අංග ලබා දෙමින් ගොවි ජනතාව සමඟ කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන එක් කර ගනිමින් 2018 වන විට මිරිස්, බී ලූණු, අල, මුං ඇට වැනි තෝරා ගත් මූලික බෝග ලැයිස්තුවකින් රට ස්වයංපෝෂිත කරවීමය. මෙම කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ධෛර්යය සහ ශක්තිය සමස්ථ ගොවි ජනතාවටත් සියලූම නිලධාරීන්ටත් ලැබේවායි පතමි.

වසන්ත අලුවිහාරේ (පා.ම)
කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය

# ඌව පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ පණිවිඩය



ආහාර සුරක්ෂිතතාවය හා විදේශීය වශයෙන් නිෂ්පාදනය කර විශාල මුදල් ප්‍රමාණයක් පිටරට වලට වැයවන ආහාර ද්‍රව්‍ය දේශීය ලෙස නිෂ්පාදනය වැඩි දියුණු කර ගැනීම අරමුණු ඇතිව වත්මන් අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ''ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන 2016 - 2018 '' වැඩසටහන වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම ඉමහත් සතුටකි.

වර්ග කිලෝමීටර් 8500 ක භූමි ප්‍රමාණයකින් යුක්තව ශ්‍රී ලංකාවේ ගිණිකොණ දෙසට මදක් බරව, රට මධ්‍යයේ පිහිටා ඇති ඌව පළාත, කෘෂිකර්මාන්තය අතින් ඉහළ විභවයක් ඇත. ඌව පළාතේ ජනගහනයෙන් 59% ක් කෘෂිකර්මාන්තයේ නියලේ. ශ්‍රී ලංකාවේ පවතින්නාවූ කෘෂි දේශගුණික කලාපයන්ගෙන් වැඩි ප්‍රමාණයක් ඌව පළාත තුළ පිහිටා තිබෙන අතර, වර්ෂාපතනය, උෂ්ණත්වය අර්ද්‍රතාවය හා පාංශු තත්ත්වයන් ඇතුළත් වූ පළාත තුළ පවතින දේශගුණික තත්ත්වයන් ඉහළ පරාසයන් පළාත තුළ පවතී. මෙම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන සියළුම බෝග වර්ග ඌව පළාත තුළ වගා කිරීමට හැකියාව ලැබී තිබීම ඉමහත් භාග්‍යයක් ලෙස සඳහන් කළ හැකි අතර, මෙම සාදක උපරිම ලෙස පල ප්‍රයොජනයට ගනිමින් ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ ඌව පළාතේ වී නිෂ්පාදනය, අතිරේක ආහාර බෝග නිෂ්පාදනය, පළතුරු නිෂ්පාදනය, එළවළු නිෂ්පාදනය හා අර්තාපල් නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරමි.

ශ්‍රී ලංකාවේ ස්වයං පෝෂිත කිරීමේ මෙම සත්කාරය මාගේ ප්‍රධාන අමත්‍ය ධූරය දරණ කාලය තුළ ක්‍රීයාත්මක කිරීමට ලැබීම ඉමහත් භග්‍යයක් ලෙස සඳහන් කළ හැකි අතර, '' ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන '' සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා යයි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

චාමර සම්පත් දසනායක
ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, විදුලිබල හා බලශක්ති, ඉඩම්, ඉදිකිරීම් සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය

# ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 13% ක් නියෝජනය කරන ඌව පළාත බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවලින් සමන්විත වන අතර, භූමි ප්‍රමාණය අනුව පළාත් අතුරින් හතර වන ස්ථානයට හිමිකම් කියයි. සාරවත් භූමිය, කෘෂිකර්මයට හිතැති දේශගුණික හා පාරසරික සාධක ජානමය උරුමයක්ව ගොවිතැනට නිතැතින්ම හුරු ශ්‍රම බලකාය හා විශාල පරාසයක පැතිරෙන භූගෝලීය ලක්ෂණ හේතුවෙන් දේශයට ආහාර සැපයීමේ නිසඟ විභවතාවයකින් ඌව පළාත ආශිර්වාද ලබා ඇත. එසේම මෑත කාලීන ගොවි ජනපද ව්‍යාපාරයන් හේතුවෙන් ලාංකේය කෘෂි කර්මාන්තයේ ඌව සලකුණ තවදුරටත් සනිටුහන් විය. ඌව පළාත කෘෂි කර්මාන්තය, සත්ව පාලනය සේම මිරිදිය ධීවර ක්ෂේත්‍රයන් තුල වත්මනෙහි ප්‍රශස්ත ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. එවන් වූ අවධියක අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ අදහසකට අනුව නිර්මිත "ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනට" සුභාශිංශන පණිවිඩයක් පිළිබඳව මම ඉතා සතුටට පත්වෙමි.

ඌව පළාතේ ආර්ථිකය මුලික වශයෙන් කෘෂිකර්මාන්තය මත රදා පවතින අතර, පළාතේ ජනගහනයෙන් 59% ක් පමණ වෘත්තීය වශයෙන් කෘෂිකර්මාන්තයේ නියැලෙයි. බෝග අස්වනු ප්‍රමාණය අන් පළාත්වලට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා අතර, ඒකක බිම් ප්‍රමාණයකින් ලැබෙන අස්වනු ප්‍රමාණයෙන් ද සැලකීමේදී ඉහළ අගයක් ගන්නා බව පැහැදිලි වේ. ඒ අනුව මෙරටට අවශ්‍ය කෘෂි නිෂ්පාදන අවශ්‍යතාවයෙන් 30% ක පමණ දායකත්වය සපයනු ලබන්නේ ද මෙම පළාතෙනි. මෙහි වගා කරන බෝගයන් අතිරින් වී, අර්තාපල් සහ බඩඉරිඟු වගාවන් ප්‍රමුඛ ස්ථානයක් ගන්නා අතර, 2014 වර්ෂයේ බිත්තර වී මෙට්‍රික් ටොන් 318 ක් ද 2015 වර්ෂයේ මේ වන විට මෙට්‍රික් ටොන් 218 ක් ද නිෂ්පාදනය කර තිබේ. එමෙන්ම උඩරට පහතරට එළවළු වගාවන් ද පළාත තුළ ව්‍යාප්තව ඇති අතර, කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා අන්තර් සම්බන්ධයක් ඇති සත්ත්ව පාලනය ද ඌව පළාතේ සාර්ථකව සිදුකෙරෙන අතර, මිරිදිය ධිවර කර්මාන්තයෙන් ද 2014 වර්ෂයේ 11% ක දායකත්වය ලබා දුන් බව සිහිපත් කරමි.

ආහාර නිෂ්පාදන වැඩසටහනෙහි වැදගත්කම, එහිලා වූ අපේ වගකීම්, කාර්යයන් හා පළාත් කෘෂිකර්ම අමාත්‍යංශයන්හි ආයතනික විභවය පිළිබඳව අවබෝධයකින් පසුවන අප ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන් ලියවිල්ලෙහි අන්තර්ගත ක්‍රමවේදයන් හරහා එකී ඉලක්කයන් මුදුන් පමුණුවා ගැනිම සඳහා කැපවන අතර, තිරසාර කෘෂිකර්මාන්තයක් හා අතමිට සරු ගොවි පරපුරක් වෙනුවෙන් ක්‍රියාත්මක වන මෙම ජාතික වැඩසටහන සාර්ථක වේවායි ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යවරයා වශයෙන් මම ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

උපාලි ඩෙල්ටන් සමරවීර
ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන, මිරිදිය ධිවර අමාත්‍ය

**ගොවිපලේ ජීවිතය ඉවසීමේ පාඨශාලාවකි. ඔබට දින දෙකකින් අස්වැන්න නෙලා ගැනීමට හෝ ගවයෙකු නිර්මාණය කර ගැනීමට නොහැක.**

**– ගත්කරු හෙන්රි ඇලේන්**

# පටුන


01. හැඳින්වීම ---------------------------------------------------------------------------------- 1-2

02. පළාත් සිතියම ---------------------------------------------------------------------------- 3

03. පළාත් ඉලක්ක සාරාංශය ------------------------------------------------------------------ 4-5

04. මොණරාගල දිස්ත්‍රික්ක ඉලක්කය ----------------------------------------------------------- 6-44

05. බදුල්ල දිස්ත්‍රික්ක ඉලක්කය ---------------------------------------------------------------- 45-98